සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 11 - 2023

# ඉතිහාසය - I

කාලය පැය 01 යි

නම/ විභාග අංකය:

සැලකිය යුතුයි :

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමිවේ.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවලට දී ඇති **(1), (2), (3), (4)** පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ **(x)** ලකුණ යොදන්න.
- ප්‍රශ්න පත්‍රයේ දී ඇති අනෙකුත් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවාද පිළිපදින්න.

---

01. ශ්‍රී ලංකාවේ සන්දේශ කාව්‍ය රචනා කිරීම ආරම්භ වූයේ, කුමන රාජධානි සමයක දී ද?
(1) දඹදෙණිය (2) කුරුණෑගල (3) ගම්පොළ (4) කෝට්ටේ

02. බෞද්ධ රාජධානි පිළිබඳ විස්තරය ලෙස හඳුන්වනු ලබන්නේ,
(1) හියුං සියැං හිමියන්ගේ දේශාටන වාර්තාවයි. (2) පාහියන් හිමියන්ගේ දේශාටන වාර්තාවයි.
(3) ඉබන් බතූතාගේ දේශාටන වාර්තාවයි. (4) ඔනෙසික්‍රිටස්ගේ දේශාටන වාර්තාවයි.

03. පහත ප්‍රකාශයන් අතරින් පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයයන්ගේ ප්‍රයෝජන සම්බන්ධයෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) සාහිත්‍ය මූලාශ්‍රය වල සඳහන් තොරතුරු සනාථ කරගත හැකි වීම
(2) සිදුවීමට සමකාලීන තොරතුරු අනාවරණය කරගත හැකි වීම
(3) සාහිත්‍ය මූලාශ්‍රවල අඩුපාඩු පූරණය කරගත හැකි වීම
(4) ඉතිහාසය පිළිබඳ වඩා විශ්වාසනීය තොරතුරු අනාවරණය කරගත හැකිවීම

04. රටක ආර්ථික තත්වය, වෙළඳාම, ලෝහ භාවිතය හා විදේශ සබඳතා ආදිය අධ්‍යයනය කිරීමේ දී වඩා වැදගත් මූලාශ්‍රය වර්ගය වන්නේ,
(1) නාණක මූලාශ්‍රය ය. (2) සාහිත්‍ය මූලාශය ය.
(3) පුරාණ නටඹුන් ය. (4) සෙල්ලිපි ය.

05. ප්‍රාග් ඓතිහාසික ගල් යුගයේ මානවයා වාසය කරන ලද බවට සාධක හමුවන පහතරට තෙත් කලාපයට අයත් ලෙන් ජනාවාසයන් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) පාහියන්ගල හා බටදොඹලෙන (2) කිතුල්ගල බෙලිලෙන හා බෙල්ලන්බැඳිපැලැස්ස
(3) බටදොඹලෙන හා පොතාන (4) බණ්ඩාරවෙල හා පාහියන්ගල

06. පහතරට තෙත් කලාපයේ විසූ ජනයා සිය ආහාරය සඳහා වැඩි වශයෙන් භාවිතකර ඇත්තේ,
(1) මුහුදු බෙල්ලන් ය. (2) වල්දෙල් ය. (3) කැලෑ කෙසෙල් ය. (4) ගොඩබිම බෙල්ලන් ය.

07. ශ්‍රී ලංකාවේ මුල්කාලීන සෙල්ලිපිවල ව්‍යාප්තිය අනුව හඳුනාගත හැකි ජනාවාස කුමන යුගයකට අයත් ද?
(1) ප්‍රාග් ඓතිහාසික ගල් යුගයට (2) පූර්ව ඓතිහාසික යුගයට
(3) මුල් ඓතිහාසික යුගයට (4) ඓතිහාසික යුගයට

08. පහත A සිට D දක්වා දී ඇති මූලාශ්‍රයන් අතරින් ශ්‍රී ලංකාවේ දේශපාලන බලය විකේන්ද්‍රගතව පැවති අවධියේ පාලකයන් පිළිබඳ තොරතුරු පමණක් අනාවරණය වන සෙල්ලිපි අඩංගු පිළිතුර තෝරන්න.
A - පෙරියපුලියන්කුලම සෙල්ලිපිය B - කණ්ඩලම කොත්ගල්කන්ද සෙල්ලිපිය
C - මුතුගල්ල සෙල්ලිපිය D - වෙහෙරකෙම සෙල්ලිපිය
(1) A හා B (2) B හා C (3) C හා D (4) D හා A



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

09. සිතුල්පව්ව කොරවක්ගල අසල ගල්ගුහාවේ දක්නට ඇති සෙල්ලිපියෙන් අනාවරණය වන තොරතුරු සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශ ඇතුළත් පිළිතුර තෝරන්න.

A - පූර්ව රාජ්‍ය සමයේ පාලන කටයුතු හා සම්බන්ධ ගමිකවරුන් පිළිබඳ

B - දුටුගැමුණු රජුගේ සටන් ව්‍යාපාරයේ දී සහය ලබාදුන් පරුමකවරුන් පිළිබඳ

C - පරුමකවරුන් ගමිකවරුන් අතරින් තේරී පත් වූ බව

D - අවට ගම්මානවල නායකයින් සුහදව කටයුතු කළ බව.

(1) A හා C (2) B හා C (3) C හා D (4) A හා D

10. දඹුලු විහාර පර්වත ලිපියේ කුටකණ්ණ අභය රජතුමා හඳුන්වා ඇති රාජ්‍යත්ව සංකල්පය කුමක් ද?

(1) බෝධිසත්ව (2) පර්වතරාජ (3) චක්‍රවර්තී (4) දේවත්ව

11. පහත සිදුවීම් අතරින් දුටුගැමුණු රජතුමාගේ රාජ්‍යතාන්ත්‍රික බව ප්‍රකට වන අවස්ථාව කුමක් ද?

(1) සංවිධානාත්මක සටන් ව්‍යාපාරයක් මෙහෙයවා ලංකාව එක්සේසත් කිරීම.

(2) ශාසනයේ යහපත උදෙසා අනුග්‍රහය දැක්වීම.

(3) එළාරගේ සොහොනට නිසි ගෞරව පැවැත්වීමට අණ කිරීම.

(4) මහා ස්ථූපය ඉදිකිරීමට සහභාගී වූ සැමදෙනාට වැටුප් ගෙවීමට නියෝග කිරීම.

12. මෙරට අතීත පාලකයන් තමන්ගේ අසල්වාසී රටවල ප්‍රජාව දෙස විශ්වාසවන්ත ලෙස කටයුතු කිරීම ඔවුන්ගේ විදේශ ප්‍රතිපත්තියේ කැපීපෙනෙන අංගයක් බවට පත්කර ගත් බව සනාථ වන කදිම අවස්ථාවක් වන්නේ,

(1) පළමුවන විජයබාහු රජතුමා විසින් පොළොන්නරු දළදා මාලිගයේ ආරක්ෂාව වේළෛක්කාර හමුදාවට භාර කිරීම.

(2) පළමුවන ගජබාහු රජතුමාට චේර රාජ්‍යයේ පත්තිනි දේවාලයක් විවෘත කිරීමේ උත්සවයකට ආරාධනා කිරීම.

(3) මිත්තා කුමරිය පාණ්ඩ්‍ය දේශයේ කුමාරයෙකු හා විවාහ වීම.

(4) ඉබන් බතුතා ශ්‍රීපාද වන්දනා කිරීමට පැමිණීම.

13. හම්බන්තොට ප්‍රදේශයේ කැණීම්වලින් හමු වූ ලෝහ මුද්‍රාව අයත්වන වෙළඳ සංවිධානය කුමක් ද?

(1) වලඤ්ඤියාර් (2) අයින්නූර්වර් (3) නානාදේසී (4) කබොජ මහපුගිය

14. දැනට හඳුනාගෙන ඇති පැරණිතම අරාබි භූගෝල විද්‍යා ග්‍රන්ථය කුමක් ද?

(1) අජායිබ් - අල් - හින්ද් (2) කිතබ් - අල් - මස්ලික්වාල් - මමාලික්

(3) ඉන්ඩිකා (4) නැවුරලිස් හිස්ටෝරියා

15. ත්‍රිපිටක ධර්මයට වැඩි විස්තර සහිත අටුවා රචනා කරන ලද ස්වාමීන් වහන්සේ වන්නේ,

(1) පාහියන් හිමියන් ය. (2) බුද්ධරක්ඛිත හිමියන් ය.

(3) මහානාම හිමියන් ය. (4) බුද්ධඝෝෂ හිමියන් ය.

16. පහත සඳහන් කෘති අතරින් සිංහල භාෂාවෙන් රචිත කෘතිය කුමක් ද?

(1) දීප වංශය (2) අභිධානප්පදීපිකා (3) සසදාවත (4) සාරප්ථදීපනී.

17. ''මොහොල'' යනුවෙන් හඳුන්වනු ලබන්නේ වැවක කුමන අංගයක් හා සම්බන්ධ ඉදිකිරීමක් ද?

(1) සොරොව්ව (2) රළපනාව (3) පිටවාන (4) ඇතුළුවාන

18. ශ්‍රී ලංකා ඉතිහාසයේ සඳහන්වන ආකාරයට පහත සඳහන් පාලකයන් අතරින් රෝහල් දහ අටක් ඉදිකරවන ලද්දේ,

(1) බුද්ධදාස රජු ය. (2) උපතිස්ස රජු ය.

(3) දුටුගැමුණු රජු ය. (4) හතරවන කාශ්‍යප රජු ය.

19. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ පහත සඳහන් නීති අතරින් නිශ්ශංකමල්ල රජතුමා විසින් පනවන ලද නීතිය කුමක් ද?

(1) වෙළඳාම් කටයුතු වල දී ප්‍රමිතිගත කරන ලද තරාදි පඩි භාවිත කළ යුතු ය.

(2) විනිශ්චය ශාලාවෙන් ලැබෙන දඩමුදල් සිතුල්පව්ව විහාරයට පූජා කළ යුතු ය.

(3) ජලාශවල ජීවත් වන පක්ෂීන් නොමැරිය යුතු ය.

(4) මිනී මැරීමට දඬුවම එල්ලා මැරීම ය.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

20. දැනට ලංකාවෙන් හමු වී ඇති රෝම කාසි නිපදවීමට වැඩි වශයෙන් යොදාගෙන ඇති ලෝහ වර්ගය කුමක් ?
(1) රන් (2) තඹ (3) රිදී (4) පිත්තල

21. පහත I තීරුවේ දක්වා ඇති පාලකයින්ට සම්බන්ධ සිදුවීම් කිහිපයක් II තීරුවේ දක්වා ඇත. I තීරුවේ පිළිවෙළට II තීරුවේ තොරතුරු ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

| I තීරුව | II තීරුව |
|---|---|
| (i) තුන්වන විජයබාහු රජු | A. බෙලිගල දළදා මැදුර ඉදිකරවීම. |
| (ii) පළමුවන බුවනෙකබාහු රජු | B. සිංහල පෙරළිය ඇතිවීම. |
| (iii) සිව්වන පැරකුම් රජු | C. කාලිංගරායරගේ ආක්‍රමණය සිදුවීම. |
| (iv) හයවන බුවනෙක බාහු රජු | D. පන්සිය පනස් ජාතක කතාපොත සිංහලට පරිවර්තනය කිරීම |

(1) ACDB (2) BCDA (3) CDAB (4) DABC

22. පෘතුගීසීන් විසින් තමන්ට ගැති පාලකයකු ලෙස උඩරට රජ පදවියට පත් කළ කරලියද්දේ බණ්ඩාර රජුගේ බෑනා කවුරුන් ද?
(1) කොනප්පු බණ්ඩාර (2) වීරසුන්දර බණ්ඩාර (3) යමසිංහ බණ්ඩාර (4) නිකපිටියේ බණ්ඩාර

23. දියෝගෝ ද මෙලෝ සෙනෙවියාට මරණය අත්කර දෙමින් උඩරට ප්‍රදේශයේ ඇති වූ සන්නද්ධ අරගලය වන්නේ,
(1) දන්තුරේ සටන යි. (2) බලන සටන යි.
(3) රන්දෙණිවල සටන යි. (4) ගන්නෝරුව සටන යි.

- **පහත සඳහන් වගුවේ දක්වා ඇති තොරතුරු ඇසුරෙන් අංක 24 හා 25 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| නිර්මාපකයා | වර්ෂය | නිර්මාණය |
|---|---|---|
| A. ජෝන් කේ | D. 1764 | G. රෝලර් යන්ත්‍රය |
| B. ජේම්ස් හාග්‍රීව්ස් | E. 1784 | H. දුවන නඩාව |
| C. හෙන්රි කෝට් | F. 1733 | I. ජෙනී යන්ත්‍රය |

24. රෙදි විවීම සම්බන්ධ තොරතුරු පමණක් ඇතුළත් පිළිතුර කුමක් ද?
(1) A, E හා H (2) A, F හා H (3) B, F හා H (4) C, D හා I

25. නූල් සකස්කිරීම සම්බන්ධ තොරතුරු පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) A, D හා I (2) B, F හා G (3) B, D හා I (4) C, D හා G

26. ක්‍රි. ව. 1600 වසරේ දී පෙරදිග ඉන්දියා වෙළඳ සමාගමට ආසියානු ප්‍රදේශවල වෙළඳ කටයුතුවල නිරතවීමට අවශ්‍ය රාජකීය බලපත්‍රයක් නිකුත් කරන ලද බ්‍රිතාන්‍ය පාලකයා කවුරුන් ද?
(1) පළමුවන ජෝර්ජ් රජු (2) තුන්වන ජෝර්ජ් රජු
(3) පළමුවන එලිසබත් රැජින (4) දෙවන එලිසබත් රැජින

27. පහත සඳහන් ස්ථාන අතරින් ප්‍රංශ ජාතිකයන් විසින් ඉන්දියාව තුළ වෙළඳ මධ්‍යස්ථානයක් පිහිටුවාගත් නගරය කුමක් ද?
(1) ගෝව (2) කරිකාල් (3) මදුරාසිය (4) කල්කටා

28. මදුරාසි පාලනය යටතේ පොල්ගස් බද්ද වශයෙන් පොල්ගස් දහයකට වැඩි ඉඩම්වලින් එක් ගසක් වෙනුවෙන් අයකරන ලද බදු මුදල වූයේ,
(1) රිදී පනම කි. (2) රිදී පනම් දෙක කි. (3) රිදී පනම් තුන කි. (4) රිදී පනම් හතර කි.

29. පහත සිදුවීම් අතරින් ශ්‍රී වික්‍රමරාජසිංහ රජු හා උඩරට ජනතාව අතර සබඳතාවය බිඳවැටීමට බලපෑ හේතුව කුමක් විය හැකි ද?
(1) රදළවරුන්ගේ බලතල සීමා කිරීම
(2) නායක්කර් වංශිකයන් හට තනතුරු හා වගකීම් ප්‍රදානය කිරීම
(3) ඇහැළේපොළ දරු පවුල අමානුෂික ලෙස ඝාතනය කිරීම
(4) රජුගේ අනුදැනුම ඇතිව භික්ෂූන් වහන්සේලා කිහිපදෙනෙකු ඝාතනය කිරීම



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

30. ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනයට විරුද්ධව ඇති වූ පළමු නිදහස් සටන හෙවත් ක්‍රි. ව. 1818 කැරැල්ල ආරම්භ වූයේ,

(1) රන්දෙණිවල ප්‍රදේශයෙනි. (2) ඌව වෙල්ලස්ස ප්‍රදේශයෙනි.

(3) මාතලේ ප්‍රදේශයෙනි. (4) මහනුවර ප්‍රදේශයෙනි.

31. පූජ්‍ය බුලත්ගම ධම්මාලංකාර සිරි සුමනතිස්ස හිමියන්ගේ මූලිකත්වයෙන් ආරම්භ කරන ලද මුද්‍රණාලය කුමක් ද?

(1) ලංකෝපකාර (2) ලංකාභිනව විශ්‍රුත (3) කවට කතික (4) සුදර්ශන

32. ශ්‍රී ලාංකිකයන් හට දේශපාලන බලතල ලබාගැනීමේ අරමුණින් පිහිටුවාගත් ලංකා ජාතික සංගමයේ ආරම්භක සභාපතිවරයා කවුරුන් ද?

(1) ශ්‍රීමත් ජේම්ස් පිරීස් මහතා (2) පොන්නම්බලම් රාමනාදන් මහතා

(3) ආචාර්ය එන්. එම්. පෙරේරා මහතා (4) පොන්නම්බලම් අරුණාචලම් මහතා

- බ්‍රිතාන්‍ය පාලනය යටතේ ලංකාවට හඳුන්වා දුන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ පිළිබඳ පහතින් දක්වා ඇති තොරතුරු ඇසුරෙන් අංක 33 හා 34 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | | |
|---|---|---|
| A 1833 | D. සීමිත ඡන්ද බලය | G. ආණ්ඩුකාර ධුරය ස්ථාපිත කිරීම. |
| B 1910 | E. රාජ්‍ය නිලධාරීන් තිදෙනා | H. උගත් ලාංකික නියෝජිතයකු පත් කිරීම. |
| C 1920 | F. පළාත්බද නියෝජන ක්‍රමය හඳුන්වා දීම. | I. ව්‍යවස්ථාදායකයේ නිල නොලත් බහුතරයක් ඇතිවීම. |

33. කෲව් මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය සම්බන්ධ තොරතුරු පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) A, D හා H (2) B, D හා C (3) B, D හා H (4) C, E හා I

34. මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය සම්බන්ධ තොරතුරු පමණක් අඩංගු පිළිතුර කුමක් ද?

(1) A, F හා I (2) B, F හා G (3) C, E හා I (4) C, F හා I

- **පහත A, B C හා D යටතේ දක්වා ඇති එක් එක් යුගලයෙහි පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධතාවය පරීක්ෂා කර බලා අංක 35 සිට 37 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A 1. ගොවිතැනට අවශ්‍ය ශ්‍රමය.
2. අත්තම් ක්‍රමය.

B 1. මහා පරිමාණ වතුවගාව.
2. ග්‍රාමීය ස්වංපෝෂිත ආර්ථිකය.

C 1. පෞද්ගලික ව්‍යවසායන් දිරි ගැන්වීම.
2. රජයේ වෙළඳ ඒකාධිකාරිය අහෝසි කිරීම.

D 1. මෝටර් රථ කර්මාන්තයේ දියුණුවීම.
2. පාරම්පරික ප්‍රභූ පන්තිය අභාවයට යාම.

35. දෙවැන්න බිඳවැටීම කෙරෙහි පළමුවැන්න උපකාරී වූ බව දැක්විය හැකි යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D

36. පළමුවැන්න ලබාගැනීම සඳහා දෙවැන්න උපකාරී වූ බව දැක්විය හැකි යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D

37. පළමුවැන්න දෙවැන්නේ අරමුණක් බව දැක්විය හැකි යුගලය තෝරන්න.

(1) A (2) B (3) C (4) D

38. පුනරුදය නිසා ඇතිවූයේ,

(1) කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කිවරුන් විසින් අල්ලා ගැනීමයි.

(2) ග්‍රීක හා ලතින් භාෂාවන් හි පිබිදීමක් ඇතිවීමයි.

(3) වැඩවසම් සමාජ ක්‍රමයක් ආරම්භ වීමයි.

(4) පුරාතන යුගයේ ලක්ෂණ ඉස්මතු වීමයි.

39. පහත තොරතුරු ඇසුරෙන් බ්‍රිතාන්‍ය පාලනය නිසා අපට දායාද වූ අහිතකර බලපෑමක් ලෙස හඳුනාගත හැක්කේ කුමක් ද?

(1) පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය (2) ස්වයංපෝෂිත අර්ථක්‍රමය බිඳවැටීම.

(3) ඉංග්‍රීසි භාෂා දැනුම පැතිරයාම. (4) අපනයන වැවිලි බෝග හඳුන්වා දීම.

40. ක්‍රි.ව. 1947 වසරේ දී මහමැතිවරණය පවත්වන ලද්දේ,

(1) පළමු ජනරජ ව්‍යාවස්ථාව යටතේ ය. (2) දෙවන ජනරජ ව්‍යවස්ථාව යටතේ ය.

(3) සෝල්බරි ආණ්ඩු ක්‍රමය යටතේ ය. (4) ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය යටතේ ය.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 11 - 2023

## ඉතිහාසය - II

කාලය පැය 03 යි

අමතර කියවීම් කාලය මිනිත්තු 10

නම/ විභාග අංකය:

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

සැලකිය යුතුයි

- I කොටසේ ප්‍රශ්න අංක 01 අනිවාර්ය වේ.
- II කොටසින් ප්‍රශ්න 4 ක් ද, III කොටසින් එක් ප්‍රශ්නයක් ද තෝරාගෙන පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

---

### I - කොටස

(01) (අ) (i) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ශ්‍රී ලංකා සියමෙහි ලකුණු කර නම් කරන්න.

පොම්පරිප්පු, මහකනදරාව වැව, කිරිඳි ඔය, පුලතිසිපුර, දෙවිනුවර, නල්ලූර්, මාදුරු ඔය, පෙඩ්රික්කොටුව, දැදුරුඔය, පුත්තලම, රයිගම, සීගිරිය (ලකුණු 12 යි.)

(ii) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ලකුණු කර නම් කරන්න.

පර්සියන් බොක්ක, සුමාත්‍රා දූපත, වැනීසිය, ඕලන්දය, කල්කටා, කොරියානු අර්ධද්වීපය (ලකුණු 06 යි.)

(ආ) (i) පහත A, B C හා D යටතේ දක්වා ඇති ප්‍රශ්නවලට අදාළ පිළිතුරු අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A. ශ්‍රී ලංකාව අවසාන වතාවට එක්සේසත් කළ කෝට්ටේ යුගයේ පාලකයා කවුරුන් ද?

B. බෞද්ධාගමික පුනරුද සමයේ සුරාපානයේ ආදීනව පැහැදිලි කරමින් සිංහල පරාභව නාට්‍ය රචනා කරන ලද්දේ කවුරුන් විසින් ද?

C. ක්‍රි.ව. 1848 කැරැල්ල ඇති වූ අවධියේ ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා ලෙස කටයුතු කළේ කවුරුන් ද?

D. දෙවන ලෝක සංග්‍රාමය අවසානයේ දී කොන්දේසි විරහිතව යටත් වූ ජපාන අධිරාජයා නම් කරන්න.

- **A** සහ **B** යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

(ii) 1. A රූපයෙන් දැක්වෙන පුද්ගලයාගේ නම සඳහන් කරන්න.

2. ඔහු විසින් පාලනය කරනලද රට කුමක් ද?

3. ඔහුගේ පාලන සමයේ දී එරට ආක්‍රමණය කරන ලද යුරෝපීය රට කුමක් ද?

4. ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශ සම්බන්ධයෙන් ඔහු විසින් ලියා ලංකාවට එවන ලද ලිපිය කුමක් ද? (ලකුණු 04 යි.)



A



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(iii) 1. B රූපයෙන් දැක්වෙන චිත්‍රයෙන් නිරූපණය වන්නේ කුමක් ද?

2. මෙය සිතුවම් කොට ඇති විහාරස්ථානය කුමක් ද?

3. මෙම සිතුවම් කුමන රාජධානි සමයකට අයත් වේ ද?

4. මෙම සිතුවම මූලාශ්‍රය කොටගෙන ඉතිහාසය පිළිබඳ අනාවරණය කරගත හැකි තොරතුරක් නම් කරන්න.



B

---

## II කොටස

02. (i) (a) ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය පිළිබඳ පැරණිතම සාධක හමුවන පාංශු ස්තරය නිර්මාණය වූ යුගය කුමක් ද?

(b) එම පාංශු ස්තරයේ තිබී මෙම යුගය පිළිබඳ හමුවන සාධක දෙකක් නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) ප්‍රාග් ඓතිහාසික ගල් යුගයේ මානවයා ජනාවාස සඳහා ප්‍රදේශ තෝරාගැනීමේ දී අවධානය යොමු කළ සාධක දෙකක් නම් කරන්න. (ලකුණු 04 යි.)

(iii) පූර්ව ඓතිහාසික යුගයේ මිනිසා තාක්ෂණය භාවිත කළ අවස්ථා දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි.)

(iv) මුල් ඓතිහාසික යුගයේ ජනාවාසයක දැකිය හැකි මූලික ලක්ෂණ 03 ක් නම් කර කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි.)

03. (i) A. කළුදියපොකුණ ලිපිය

B. කණ්ඩලම කොත්ගල්කන්ද ලිපිය

C. බ්‍රාහ්මණයාගම ලිපිය

ඉහත A, B හා C ලෙස දක්වා ඇති සෙල්ලිපිවල සඳහන් පූර්ව රාජ සමයේ දේශපාලන කටයුතු හා සම්බන්ධ තනතුරු නාමයන් පිළිවෙළින් ලියා දක්වන්න. (ලකුණු 03 යි.)

(ii) පහත දැක්වෙන ඓතිහාසික සිදුවීම් සම්බන්ධ පාලකයන් අනුපිළිවෙළින් නම් කරන්න.

A. රෝමානුක දේශයට දූතයන් යවා රතු වීදුරු පබළු ගෙන්වා ගැනීම.

B. දකුණු ඉන්දියානු කුලී භේවායන්ගේ සහය පැතූ මුල්ම ශ්‍රී ලාංකික පාලකයා,

C. අනුරාධපුරයේ රජ බවට පත් වංකනාසිකතිස්ස රජුගේ, පියා

D. ධාතුසේන රජුගෙන් රාජ්‍ය පැහැරගත් පාලකයා. (ලකුණු 04 යි.)

(iii) දේවානම්පියතිස්ස රාජ්‍ය සමයේ දේශපාලන වැදගත්කම කරුණු දෙකක් යටතේ විස්තර කරන්න. (ලකුණු 05 යි.)

(iv) පොළොන්නරුවේ පාලකයන් විදේශ රටවල් සමග පැවැත් වූ සබඳතාවල ස්වරූපය උදාහරණ තුනක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි.)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

04. (i) ශ්‍රී ලංකාවේ පළමු නාගරීකරණ සමයට අයත් පොකුණු තුනක් නම් කරන්න. (ලකුණු 03 යි.)

(ii) (a) අනුරාධපුර යුගයේ පාලකයන් විසින් ඉදිකරවන ලද රෝහල් දෙකක් ද, (ලකුණු 02 යි.)

(b) අතීත ශ්‍රී ලංකාවේ යකඩ නිස්සාරණය කිරීම පිළිබඳ සාධක හමුවන ප්‍රදේශ දෙකක් ද නම් කරන්න. (ලකුණු 02 යි.)

(iii) දෙවන නාගරීකරණය අවධියේ අධ්‍යාපන හා ශාස්ත්‍රීය කටයුතුවල දියුණුවක් ඇතිවීමට බලපෑ හේතු දෙකක් නම් කර කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි.)

(iv) දෙවන පැරකුම් රජතුමාගෙන් සිදු වූ සේවාවන් තුනක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි.)

05. (i) උඩරට රාජධානියේ පාලකයන් හා පෘතුගීසීන් අතර ඇති වූ සටන් තුනක් සඳහන් කරන්න. (ලකුණු 03 යි.)

(ii) පහත A සිට D දක්වා ඇති ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුරු වරහන් තුළින් තෝරා අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A. ක්‍රි. ව. 1521 විජයබා කොල්ලය සඳහා ආධාරක සේවා සැපයූ උඩරට පාලකයා.

B. බුරුම දේශයෙන් උපසම්පදා භික්ෂූන් වහන්සේලා වැඩමකරවා ලංකාවේ උපසම්පදාව පිහිටුවීමට කටයුතු කළ පළමු නායක්කර් වංශික පාලකයා.

C. කන්නසාමි කුමරුට උඩරට රජවීම සඳහා උපකාර කළ උඩරට මහාධිකාරම්වරයා

D. ක්‍රි. ව. 1818 පළමු නිදහස් සටනේ දී ඉංග්‍රීසීන් ට පක්ෂව කටයුතු කළ සතර කෝරලය ප්‍රදේශය භාරව කටයුතු කළ උඩරට රදළවරයා

(පිළිමතලාවේ, ජයවීර බණ්ඩාර, වීරසුන්දර බණ්ඩාර, ඇහැලේපොළ, කීර්ති ශ්‍රී රාජසිංහ, විජය රාජසිංහ, මොල්ලිගොඩ) (ලකුණු 04 යි.)

(iii) උඩරට බලය ලබා ගැනීම සඳහා පෘතුගීසීන් එල්ල කළ සියලු ආක්‍රමණ අසාර්ථක වීමට බලපෑ හේතු 02 ක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි.)

(iv) උඩරට පාලන කටයුතු හා සම්බන්ධ ආයතන තුනක් නම්කර එම ආයතනයන්හි කාර්යභාරය සැකෙවින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

06. (i) ශ්‍රී ලංකාවේ පළමු බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරුන් තිදෙනා නම් කරන්න. (ලකුණු 03 යි.)

(ii) ඉංග්‍රීසීන් හට උඩරට රාජ්‍යය යටත්කර ගැනීමට හෝ අවනත කරගැනීමට අවශ්‍යතාවයන් ඇතිවීම කෙරෙහි බලපෑ හේතු හතරක් නම් කරන්න. (ලකුණු 04 යි.)

(iii) උඩරට රාජධානිය ඉංග්‍රීසීන් යටතට පත්වීමට බලපෑ හේතු දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි.)

(iv) ක්‍රි. ව. 1848 දෙවන නිදහස් සටන ඇතිවීමට බලපෑ හේතු තුනක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි.)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

07. (i) කෝල්බෲක් නිර්දේශයන්ට අනුව විධායක සභාවට යෝජනා වූ නිළධාරීන් තිදෙනෙකු නම් කරන්න. (ලකුණු 03 යි.)

(ii) කෝල්බෲක් ප්‍රතිසංස්කරණවලට විරුද්ධව පෙත්සම් ඉදිරිපත් කරමින් නව ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ඉල්ලා සිටි සංගම් හතරක් නම් කරන්න. (ලකුණු 04 යි.)

(iii) අමද්‍යප ව්‍යාපාරය යනු කුමක් දැයි හඳුන්වා එහි නායකයින් ගෙන ගිය උද්ඝෝෂණ ව්‍යාපාරයේ කැපී පෙනෙන ලක්ෂණ දෙකක් විස්තර කරන්න. (ලකුණු 05 යි.)

(iv) ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ කැපීපෙනෙන ලක්ෂණ තුනක් සැකෙවින් හඳුන්වා දෙන්න. (ලකුණු 06 යි.)

## III කොටස

08. (i) පුනරුද සමයේ පල්ලියේ ආධිපත්‍ය විවේචනය කළ පුද්ගලයින් තිදෙනෙකු නම් කරන්න. (ලකුණු 03 යි.)

(ii) මධ්‍යතන යුගයේ කලා ශිල්ප ක්ෂේත්‍රයේ කැපී පෙනෙන ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 04 යි.)

(iii) පුනරුද සමයේ ලෝක දේශපාලන අංශයේ සිදු වූ වෙනස්කම් දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)

(iv) යුරෝපයේ ඇති වූ පුනරුදයේ ආභාසය ලෝකය පුරා පැතිරයාමට බලපෑ හේතු තුනක් දක්වා කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි.)

09. (i) කාර්මික විප්ලවය සම්බන්ධ පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(a) කාර්මික විප්ලවය ආරම්භ වූ රට

(b) කාර්මික විප්ලවය අවධියේ දී දියුණුවට පත් ප්‍රධාන ක්ෂේත්‍ර දෙක නම් කරන්න. (ලකුණු 03 යි.)

(ii) කාර්මික විප්ලවය අවධියේ කෘෂිකර්ම අංශය දියුණු වීමට බලපෑ හේතු හතරක් නම් කරන්න. (ලකුණු 04 යි.)

(iii) කාර්මික විප්ලවය අවධියේ ප්‍රවාහන ක්ෂේත්‍රයේ දියුණුවක් අවශ්‍ය වීමට බලපෑ හේතු දෙකක් නම් කර කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි.)

(iv) කාර්මික විප්ලවයේ සාමාජීය බලපෑම් තුනක් නම්කර ඒ පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි.)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(01) (අ) (i)
(01) (*a*) (i)
(01) (அ) (i)




iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(01) (අ) (ii)
(01) (*a*) (ii)
(01) (அ) (ii)



## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(3) | 2 -(2) | 3 -(4) | 4 -(1) | 5 -(1) | 6 -(4) | 7 -(3) | 8 -(1) | 9 -(2) | 10 -(4) |
| 11-(3) | 12 -(1) | 13 -(3) | 14 -(2) | 15 -(4) | 16 -(3) | 17 -(1) | 18 -(3) | 19 -(3) | 20 -(2) |
| 21-(1) | 22 -(3) | 23 -(4) | 24 -(2) | 25 -(3) | 26 -(4) | 27 -(2) | 28 -(2) | 29 -(3) | 30 -(2) |
| 31-(1) | 32 -(4) | 33 -(3) | 34 -(4) | 35 -(2) | 36 -(1) | 37 -(3) | 38 -(4) | 39 -(2) | 40 -(3) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II පත්‍රය - I කොටස

(01) (අ) (i) ලංකා සිතියමේ නිවැරදිව ලකුණු කර නම් කර ඇති ස්ථානවලට ලකුණු පිරිනමන්න.

(ii) ලෝක සිතියමේ නිවැරදිව ලකුණු කර නම් කර ඇති ස්ථානවලට ලකුණු පිරිනමන්න.





(ආ) (i) A - vi පැරකුම් රජතුමා B - ජෝන්ද සිල්වා මහතා
C - ටොරින්ටන් සාමිවරයා D - හිරෝහිතෝ අධිරජයා

(ii) 1. පස්වන විලියම් (ඔරේන්ජ් හි පස්වන විලියම්)
2. ඕලන්දය (නෙදර්ලන්තය)
3. ප්‍රංශය
4. කිවු ලිපිය

(iii) 1. ආහාර අනුභව කරන පිරිසක් (රසවත් ආහාරක් බුක්තිවිඳින පිරිසක්)
2. මුල්කිරිගල විහාරය
3. මහනුවර
4. මහනුවර යුගයේ සමාජ ජීවිතය (ආහාර / ඇඳුම් පැළඳුම් / ගේ දොර උපකරණ)
තාක්ෂණය (ගෘහ නිර්මාණ ශිල්පය)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

II කොටස

02. (i) A ප්ලයිස්ටොසීන යුගය

B - ආහාරයටගත් වඳ වී ගිය සතුන්ගේ ඇට කැබලි
- ශිලා මෙවලම්

(ii) ⋆ ආහාර පාන සපයා ගැනීමේ පහසුව
⋆ ශිලා මෙවලම් තනාගැනීමට අවශ්‍ය පාෂාන බහුලව පැවතීම.

(iii) ⋆ නිවාස ඉදිකිරීමේ දී ⋆ මැටි බඳුන් නිපදවීමේ දී
⋆ සුසාන ක්‍රම ඉදිකිරීමේ දී ⋆ යකඩ මෙවලම් ඉදිකිරීමේ දී
⋆ මැටි මෙවලම් ඉදිකිරීමේ දී

(iv) ⋆ ගංගා නිම්නයට පිටතින් පිහිටා තිබීම.
⋆ කුඩාගම් වැවක් කේන්ද්‍රගත කොටගෙන පිහිටා තිබීම.
⋆ වෘත්තීන් අනුව වෙන්ව පැවතීම.
⋆ වැටකින් ආරක්ෂා වූ හෝ නොවූ ගම්මාන පිහිටා තිබීම.

03. (i) A- දසගම් ඇත්තන් B - පරුමක C - පරුමකලු

(ii) A - භාතිකාභය රජතුමා B - ඉලනාග රජතුමා C - වසභ
D - කාශ්‍යප / I කාශ්‍යප / සීගිරි කාශ්‍යප

(iii) ⋆ මෞර්ය පාලන ක්‍රමය
⋆ මෞර්ය අභිෂේක ක්‍රමය
⋆ අශෝක අධිරාජ්‍යා සමග මිත්‍ර සබඳතා පැවැත්වීම.

(iv) විවාහ - I විජයබාහු රජු කාලිංග වංශික තිලෝක සුන්දරී බිසට විවාහ කරගැනීම.
මිත්තා කුමරිය පාණ්ඩ්‍ය කුමාරයෙකු හා විවාහ වීම.

ආගමික - විජයබාහු රජතුමා බුරුම දේශයෙන් උපසම්පදාව වැඩම කිරීම.

සුහද සබඳතා / විදේශීය හමුදා සහය - විජයබාහු රජු දළදා මාළිගයේ ආරක්ෂාව වේලක්කාර කුලී හමුදාවට භාර කිරීම.
- කාලිංග වංශික කුමාරවරු පොළොන්නරුවේ රජ වීම.
⋆ නිශ්ශංකමල්ල
⋆ සහස්සමල්ල
⋆ චෝඩංග

04. (i) ඇත් පොකුණ, කුට්ටම් පොකුණ, කුමාර පොකුණ, නෙළුම් පොකුණ

(ii) a - උපසග්ගරෝගනාස, පසවන්තිනාම ශාලා, සිවිකාශාලා
b - සමනල වැව ප්‍රදේශය / සීගිරිය අලකොළවැව දෙහිගහ ඇළකන්ද

(iii) ⋆ රාජ්‍ය අනුග්‍රහය ⋆ දේශපාලන ස්ථාවරත්වය ⋆ අධ්‍යාපන කටයුතුවල දියුණුව

(iv) ⋆ කාලිංගමාඝ පරාජයට පත් කිරීම ⋆ චන්ද්‍රභානුගේ ආක්‍රමණ මර්ධනය කිරීම.
⋆ දඹදෙණි දළදා මාළිගය ඉදිකිරීම. ⋆ සාහිත්‍ය ප්‍රබෝධය උදෙසා කැපවීම.

05. (i) දන්තුරේ, බලන, ගන්නෝරුව, රන්දෙණිවෙල

(ii) A ජයවීර බණ්ඩාර B. විජය රාජසිංහ රජු C. පිළිමතලාව අධිකාරම්තුමා.
D. මොල්ලිගොඩ

(iii) ⋆ උඩරට ජනයාගේ රාජපාක්ෂික බව.
⋆ උඩරටට ලැබී තිබූ ස්වභාවික රැකවරණය.
⋆ සිංහලයන්ගේ සටන් ක්‍රම.
⋆ පෘතුගීසීන් සමග පැමිණි කුලී හමුදාව උඩරට රජුට සහය වීම.

(iv) ⋆ මාලිගාව (නිළදාරීන් හා පාලනය සම්බන්ධවන අයුරු විස්තර කිරීම.)
⋆ රටවසම
⋆ මහබද්ද
⋆ විහාර දේවාලගම්



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

06. (i) ප්‍රෙඩ්රික් නෝත්, තෝමස් මේට්ලන්ට්, රොබට් බ්‍රවුන්රිග්

(ii)
- ★ කොළඹ හා ත්‍රිකුණාමලය අතර ගොඩබිම් සබඳතා පැවැත්වීමට උඩරට රජුගෙන් ආධාර ඉල්ලා සිටිමුත් රජු ඊට අවසර ලබා නොදීම.
- ★ උඩරට පහතරට වෙළඳාමේ දී කඩවත් වලදී රජුට බදු ගෙවීමට සිදුවීම.
- ★ උඩරට රජු ප්‍රංශ ජාතිකයන්ගෙන් සහය ලබාගනු ඇති බවට ඇති වූ සැකය.
- ★ බ්‍රිතාන්‍යන්ට විරුද්ධ මුහුදුබඩ වැසියා කැරළි ගසන විට උඩරට කැරළිකරුවන්ට සහය දීම.
- ★ පහතරට වැසියා උඩරට රජු තම රජුවශයෙන් පිළිගැනීම.
- ★ මුහුදුබඩ සීමාව හා උඩරට පහතරට දේශ සීමාව ආරක්ෂා කිරීමට හමුදා කණ්ඩායම් දෙකක් යෙදවීමට සිදුවීම වියදම් අධික වීම.

(iii)
- ★ උඩරට රජු හා රදළවරුන් අතර මතභේද ඇතිවීම.
- ★ රජු හා භික්ෂූන් වහන්සේලා අතර මතභේද ඇතිවීම.
- ★ රජු හා මහජනතාව අතර සබඳතා බිඳ වැටීම.
- ★ ඉංග්‍රීසීන්ගේ උපක්‍රමශීලී ක්‍රියා.

(iv)
- ★ කෝල්බෲක් ප්‍රතිසංස්කරණ
- ★ රජය හා මහජනතාව අතර සබඳතාවය දුරස් වීම.
- ★ ටොරින්ටන් සාමිවරයාගේ බදු ප්‍රතිපත්තිය.

07. (i) යටත් විජිත ලේකම්, භාණ්ඩාගාරික, ගණකාධිකාරී, මිනුම්පති, කොළඹ රේගු අයකැමි

(ii)
- ★ පහතරට නිෂ්පාදන සංගමය
- ★ හලාවත සංගමය
- ★ යාපන සංගමය
- ★ ලංකා සංගමය

(iii)
- ★ බ්‍රිතාන්‍ය ජාතිකයන් ලංකාවට හඳුන්වා දුන් සුරාබදු පනතට එරෙහිව පිහිටුවාගත් සංවිධානය.
- ★ සමාජය මුහුණ දුන් ගැටළු විස්තර කිරීම.

ලක්ෂණ -
- ★ රජයේ සුරාබදු පහතරට විරුද්ධ මහජන මතයක් ගොඩනැගීම.
- ★ මධ්‍යස්ථ උපදෙස් හා ආගමික පුනරුදයේ නායකයින් එකම අරමුණක් උදෙසා ඒක රාශී වීම.
- ★ ලංකාව පුරා අමද්‍යප සංවිධානයේ ශාකා පිහිටු වීම.
- ★ ආණ්ඩුව විවේචනය කිරීම ආදී

08. (i) ජොන් වයික්ලිප්, බොහිමියාවේ ජෝන් හස්, ප්‍රංශයේ ඉරාමස්, මාටින් ලූතර්

(ii)
- ★ කලා ශිල්පීන් ශ්‍රේණි වශයෙන් සංවිධානය වී තිබීම.
- ★ නිර්මාණ ශිල්ප ශ්‍රේණි වල නමින් හැඳින්වීම.
- ★ කලා ශිල්ප ආගමට නැඹුරු වීම.
- ★ පල්ලිය පමණක් කලාවට අනුග්‍රහය දැක්වීම.
- ★ ස්වාධීනව නිර්මාණ කිරීමට අවස්ථාව නොලැබීම.

(iii)
- ★ ජාතික රාජ්‍ය බිහිවීම.
- ★ ජනතාව එක් රටක් එක් ජාතියක් ලෙස කටයුතු කිරීමට පෙළඹීම.
- ★ මධ්‍යම පන්තියක් බිහිවීම.
- ★ මධ්‍යම පන්තියේ හා ධනවත් වෙළඳුන්ගේ සහය රජුට හිමිවීම.

(iv)
- ★ දේශ ගවේෂණ කටයුතු දියුණු වීම.
- ★ යටත් විජිත පිහිටුවා ගැනීම.
- ★ යටත් විජිතවල දරුවන් අධ්‍යාපනය ලැබීම සඳහා යුරෝපයට පැමිණීම.
- ★ මුද්‍රණ කර්මාන්තයේ දියුණුව.

09. (i ) a - බ්‍රිතාන්‍ය b - කාර්මික, තාක්ෂණික

(ii)
- ★ ඉඩම් කොටු කිරීමේ ව්‍යාපාරය (මහ පරිමාණ ගොවි බිම් ආරම්භය)
- ★ ශෂ්‍ය මාරු ක්‍රමය වැනි නව වගා ක්‍රම හඳුන්වා දීම.
- ★ සත්ව පාලන කටයුතු සඳහා නව තාක්ෂණ භාවිතා කිරීම.
- ★ නව කෘෂි කාර්මික ක්‍රම හා උපකරණ භාවිතය.
- ★ නව පොහොර වර්ග සොයා ගැනීම.

(iii)
- ★ කර්මාන්තශාලා සඳහා අවශ්‍ය කරන අමුද්‍රව්‍ය කර්මාන්තශාලාවට රැගෙන ඒම.
- ★ නිෂ්පාදන ද්‍රව්‍ය වෙළඳපොළ කරා රැගෙන යාම.

(iv)
- ★ භාණ්ඩ සුලභවීම.
- ★ භාණ්ඩවල මිල ඉහළයාම.
- ★ රැකිරක්ෂා සුලභවීම.
- ★ ජීවන තත්වය උසස්තත්වයකට පත් වීම.
- ★ පරිසර දූෂණය
- ★ අධික නාගරීකරණය හා නාගරික ගැටළු



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

### පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(3) | 2 -(2) | 3 -(4) | 4 -(1) | 5 -(1) | 6 -(4) | 7 -(3) | 8 -(1) | 9 -(2) | 10 -(4) |
| 11-(3) | 12 -(1) | 13 -(3) | 14 -(2) | 15 -(4) | 16 -(3) | 17 -(1) | 18 -(3) | 19 -(3) | 20 -(2) |
| 21-(1) | 22 -(3) | 23 -(4) | 24 -(2) | 25 -(3) | 26 -(4) | 27 -(2) | 28 -(2) | 29 -(3) | 30 -(2) |
| 31-(1) | 32 -(4) | 33 -(3) | 34 -(4) | 35 -(2) | 36 -(1) | 37 -(3) | 38 -(4) | 39 -(2) | 40 -(3) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

### II පත්‍රය - I කොටස

(01) (අ) (i) ලංකා සිතියමේ නිවැරදිව ලකුණු කර නම් කර ඇති ස්ථානවලට ලකුණු පිරිනමන්න.

(ii) ලෝක සිතියමේ නිවැරදිව ලකුණු කර නම් කර ඇති ස්ථානවලට ලකුණු පිරිනමන්න.






(ආ) (i) A - vi පැරකුම් රජතුමා B - ජෝන්ද සිල්වා මහතා

C - ටොරින්ටන් සාමිවරයා D - හිරෝහිතෝ අධිරජයා

(ii) 1. පස්වන විලියම් (ඔරේන්ජ් හි පස්වන විලියම්)

2. ඕලන්දය (නෙදර්ලන්තය)

3. ප්‍රංශය

4. කිවු ලිපිය

(iii) 1. ආහාර අනුභව කරන පිරිසක් (රසවත් ආහාරක් බුක්තිවිඳින පිරිසක්)

2. මුල්කිරිගල විහාරය

3. මහනුවර

4. මහනුවර යුගයේ සමාජ ජීවිතය (ආහාර / ඇඳුම් පැළඳුම් / ගේ දොර උපකරණ) තාක්ෂණය (ගෘහ නිර්මාණ ශිල්පය)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

## II කොටස

02. (i) A ප්ලයිස්ටොසීන යුගය
B - ආහාරයටගත් වඳ වී ගිය සතුන්ගේ ඇට කැබලි
- ශිලා මෙවලම්

(ii) ★ ආහාර පාන සපයා ගැනීමේ පහසුව
★ ශිලා මෙවලම් තනාගැනීමට අවශ්‍ය පාෂාන බහුලව පැවතීම.

(iii) ★ නිවාස ඉදිකිරීමේ දී ★ මැටි බඳුන් නිපදවීමේ දී
★ සුසාන ක්‍රම ඉදිකිරීමේ දී ★ යකඩ මෙවලම් ඉදිකිරීමේ දී
★ මැටි මෙවලම් ඉදිකිරීමේ දී

(iv) ★ ගංගා නිම්නයට පිටතින් පිහිටා තිබීම.
★ කුඩාගම් වැවක් කේන්ද්‍රගත කොටගෙන පිහිටා තිබීම.
★ වෘත්තීන් අනුව වෙන්ව පැවතීම.
★ වැටකින් ආරක්ෂා වූ හෝ නොවූ ගම්මාන පිහිටා තිබීම.

03. (i) A- දසගම් ඇත්තන් B - පරුමක C - පරුමකලු

(ii) A - භාතිකාභය රජතුමා B - ඉලනාග රජතුමා C - වසභ
D - කාශ්‍යප / I කාශ්‍යප / සීගිරි කාශ්‍යප

(iii) ★ මෞර්ය පාලන ක්‍රමය
★ මෞර්ය අභිෂේක ක්‍රමය
★ අශෝක අධිරාජ්‍යා සමඟ මිත්‍ර සබඳතා පැවැත්වීම.

(iv) විවාහ - I විජයබාහු රජු කාලිංග වංශික තිලෝක සුන්දරී බිසට විවාහ කරගැනීම.
මිත්තා කුමරිය පාණ්ඩ්‍ය කුමාරයෙකු හා විවාහ වීම.
ආගමික - විජයබාහු රජතුමා බුරුම දේශයෙන් උපසම්පදාව වැඩම කිරීම.
සුහද සබඳතා / විදේශීය හමුදා සහය - විජයබාහු රජු දළදා මාළිගයේ ආරක්ෂාව වේලක්කාර කුලී හමුදාවට භාර කිරීම.
- කාලිංග වංශික කුමාරවරු පොළොන්නරුවේ රජ වීම.
★ නිශ්ශංකමල්ල
★ සහස්සමල්ල
★ චෝඩගංග

04. (i) ඇත් පොකුණ, කුට්ටම් පොකුණ, කුමාර පොකුණ, නෙළුම් පොකුණ

(ii) a - උපසග්ගරෝගනාස, පසවන්තිනාම ශාලා, සිවිකාශාලා
b - සමනල වැව ප්‍රදේශය / සීගිරිය අලකොළවැව දෙහිගහ ඇළකන්ද

(iii) ★ රාජ්‍ය අනුග්‍රහය ★ දේශපාලන ස්ථාවරත්වය ★ අධ්‍යාපන කටයුතුවල දියුණුව

(iv) ★ කාලිංගමාඝ පරාජයට පත් කිරීම ★ චන්ද්‍රභානුගේ ආක්‍රමණ මර්ධනය කිරීම.
★ දඹදෙණි දළදා මාළිගය ඉදිකිරීම. ★ සාහිත්‍ය ප්‍රබෝධය උදෙසා කැපවීම.

05. (i) දන්තුරේ, බලන, ගන්නෝරුව, රන්දෙණිවෙල

(ii) A ජයවීර බණ්ඩාර B. විජය රාජසිංහ රජු C. පිළිමතලාව අධිකාරම්තුමා.
D. මොල්ලිගොඩ

(iii) ★ උඩරට ජනයාගේ රාජපාක්ෂික බව.
★ උඩරටට ලැබී තිබූ ස්වභාවික රැකවරණය.
★ සිංහලයන්ගේ සටන් ක්‍රම.
★ පෘතුගීසීන් සමඟ පැමිණි කුලී හමුදාව උඩරට රජුට සහය වීම.

(iv) ★ මාළිගාව (නිළදාරීන් හා පාලනය සම්බන්ධවන අයුරු විස්තර කිරීම.)
★ රටවසම
★ මහබද්ද
★ විහාර දේවාලගම්



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

06. (i) ෆ්‍රෙඩ්රික් නෝත්, තෝමස් මේට්ලන්ට්, රොබට් බ්‍රවුන්රිග්

(ii) ★ කොළඹ හා ත්‍රිකුණාමලය අතර ගොඩබිම් සබඳතා පැවැත්වීමට උඩරට රජුගෙන් ආධාර ඉල්ලා සිටිමුත් රජු ඊට අවසර ලබා නොදීම.
★ උඩරට පහතරට වෙළඳාමේ දී කඩවත් වලදී රජුට බදු ගෙවීමට සිදුවීම.
★ උඩරට රජු ප්‍රංශ ජාතිකයන්ගෙන් සහය ලබාගනු ඇති බවට ඇති වූ සැකය.
★ බ්‍රිතාන්‍යයන්ට විරුද්ධ මුහුදුබඩ වැසියා කැරළි ගසන විට උඩරට කැරළිකරුවන්ට සහය දීම.
★ පහතරට වැසියා උඩරට රජු තම රජුවශයෙන් පිළිගැනීම.
★ මුහුදුබඩ සීමාව හා උඩරට පහතරට දේශ සීමාව ආරක්ෂා කිරීමට හමුදා කණ්ඩායම් දෙකක් යෙදවීමට සිදුවීම වියදම් අධික වීම.

(iii) ★ උඩරට රජු හා රදළවරුන් අතර මතභේද ඇතිවීම.
★ රජු හා භික්ෂූන් වහන්සේලා අතර මතභේද ඇතිවීම.
★ රජු හා මහජනතාව අතර සබඳතා බිඳ වැටීම.
★ ඉංග්‍රීසීන්ගේ උපක්‍රමශීලී ක්‍රියා.

(iv) ★ කෝල්බෲක් ප්‍රතිසංස්කරණ
★ රජය හා මහජනතාව අතර සබඳතාවය දුරස් වීම.
★ ටොරින්ටන් සාමිවරයාගේ බදු ප්‍රතිපත්තිය.

07. (i) යටත් විජිත ලේකම්, භාණ්ඩාගාරික, ගණකාධිකාරී, මිනුම්පති, කොළඹ රේගු අයකැමි

(ii) ★ පහතරට නිෂ්පාදන සංගමය ★ හලාවත සංගමය
★ යාපන සංගමය ★ ලංකා සංගමය

(iii) ★ බ්‍රිතාන්‍ය ජාතිකයන් ලංකාවට හඳුන්වා දුන් සුරාබදු පනතට එරෙහිව පිහිටුවාගත් සංවිධානය.
★ සමාජය මුහුණ දුන් ගැටළු විස්තර කිරීම.

ලක්ෂණ - ★ රජයේ සුරාබදු පහතරට විරුද්ධ මහජන මතයක් ගොඩනැගීම.
★ මධ්‍යස්ථ උපදෙස් හා ආගමික පුනරුදයේ නායකයින් එකම අරමුණක් උදෙසා ඒක රාශී වීම.
★ ලංකාව පුරා අමද්‍යප සංවිධානයේ ශාඛා පිහිටු වීම.
★ ආණ්ඩුව විවේචනය කිරීම ආදී

08. (i) ජොන් වයික්ලිප්, බොහිමියාවේ ජෝන් හස්, ප්‍රංශයේ ඉරාමස්, මාටින් ලූතර්

(ii) ★ කලා ශිල්පීන් ශ්‍රේණි වශයෙන් සංවිධානය වී තිබීම.
★ නිර්මාණ ශිල්ප ශ්‍රේණි වල නමින් හැඳින්වීම.
★ කලා ශිල්ප ආගමට නැඹුරු වීම.
★ පල්ලිය පමණක් කලාවට අනුග්‍රහය දැක්වීම.
★ ස්වාධීනව නිර්මාණ කිරීමට අවස්ථාව නොලැබීම.

(iii) ★ ජාතික රාජ්‍ය බිහිවීම.
★ ජනතාව එක් රටක් එක් ජාතියක් ලෙස කටයුතු කිරීමට පෙළඹීම.
★ මධ්‍යම පන්තියක් බිහිවීම.
★ මධ්‍යම පන්තියේ හා ධනවත් වෙළඳුන්ගේ සහය රජුට හිමිවීම.

(iv) ★ දේශ ගවේෂණ කටයුතු දියුණු වීම.
★ යටත් විජිත පිහිටුවා ගැනීම.
★ යටත් විජිතවල දරුවන් අධ්‍යාපනය ලැබීම සඳහා යුරෝපයට පැමිණීම.
★ මුද්‍රණ කර්මාන්තයේ දියුණුව.

09. (i ) a - බ්‍රිතාන්‍ය b - කාර්මික, තාක්ෂණික

(ii) ★ ඉඩම් කොටු කිරීමේ ව්‍යාපාරය (මහ පරිමාණ ගොවි බිම් ආරම්භය)
★ ශෂ්‍ය මාරු ක්‍රමය වැනි නව වගා ක්‍රම හඳුන්වා දීම.
★ සත්ව පාලන කටයුතු සඳහා නව තාක්ෂණ භාවිතා කිරීම.
★ නව කෘෂි කාර්මික ක්‍රම හා උපකරණ භාවිතය.
★ නව පොහොර වර්ග සොයා ගැනීම.

(iii) ★ කර්මාන්තශාලා සඳහා අවශ්‍ය කරන අමුද්‍රව්‍ය කර්මාන්තශාලාවට රැගෙන ඒම.
★ නිෂ්පාදන ද්‍රව්‍ය වෙළඳපොළ කරා රැගෙන යාම.

(iv) ★ භාණ්ඩ සුළභවීම. ★ භාණ්ඩවල මිල ඉහළයාම.
★ රැකිරක්ෂා සුලභවීම. ★ ජීවන තත්වය උසස්තත්වයකට පත් වීම.
★ පරිසර දූෂණය ★ අධික නාගරීකරණය හා නාගරික ගැටළු



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub